---

**පන්විල ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**--------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 09 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 16 දින ද විගණනයට ඉදිරිපත් තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පන්විල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය රු.247,000 ක් වියයුතු වුව ද, රු.406,070 ක් ලෙස දැක්වීමෙන්, ජංගම වත්කම් රු.159,070 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ ගාස්තු වටිනාකම රු.717,685 ක් වුව ද, රු.888,458 ක් ලෙස දැක්වීමෙන්, එම ගිණුම රු.170,773 ක් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 05 කට අදාළව ගිණුම අනුව, ශේෂයන්ගේ එකතුව රු.598,904 ක් වූ අතර, ඊට අදාළව උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු. 570,145 ක් විය.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සභාවට අයත් රු.4,119,160 ක් වටිනා ඉඩම් 35 ක් සඳහා හිමිකම් තහවුරු කිරීමේ ඔප්පු/ ලේඛන ලබා ගෙන නොතිබිණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.532,115 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.377,301 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 1,652 | 1,443 | 722 |
| (ii) | බදු කුලී | 1,171 | 1,318 | 100 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 678 | 789 | 05 |
| (iv) | වෙනත් ආදායම් | 640 | 828 | 207 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 717,685 |
| (ii) | මුද්දර ගාස්තු | 247,000 |

**2.2.3 <u>දැන්වීම් පුවරු ගාස්තු.</u>**

1988 අගොස්තු 23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ (අ) කොටසෙහි, පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ඡේදය ප්‍රකාරව වර්ග අඩියකට රු.20 බැගින් බැනර් හා දැන්වීම් පුවරු සඳහා අය කිරිමට ප්‍රාදේශීය සභාව විසින් විධි විධාන සළසා තිබුණ ද, ඒ අනුව, කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට රු.31,200 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 <u>**පරිසර බලපත්‍ර ගාස්තු.**</u>

සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර අය කළයුතු ආයතන/ ව්‍යාපාර ස්ථාන 56 ක් සඳහා 2012 නොවැම්බර් 21 දින වන විට එම බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන්, සභාවට ලැබියයුතු රු.224,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

**2.3 <u>නිෂ්ක්‍රීය සම්පත්.</u>**

කසළ කළමනාකරණය සඳහා 2008 වර්ෂයේ දි පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබී තිබු අංක WP-2808 දරන අත් ට්‍රැක්ටරය සහ ට්‍රේලරය වසර 04 ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන, ගාල් කර තිබුණි.

**3. <u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වැය ලේඛනය නඩත්තුව